(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 43]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 නොවැම්බර් මස 17 වැනි සඳුදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0002/'08

1\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අද වන විට ඇති ව්‍යවස්ථාපිත මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) ක්‍රියාත්මකව පවතින වාණිජ සංස්ථා සංඛ්‍යාව කොපමණද;

(iii) ආරම්භයේදී වෙන් කරන ලද ප්‍රාග්ධනය සහ අද වන විට ඇති ශුද්ධ දේපල වටිනාකම කොපමණද; සහ

(iv) රජයට අයත් පූර්ණ අයිතිය ඇති සමාගම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයට කොටස් තිබෙන උප වෙළෙඳ සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) කොටස්වල ප්‍රතිශතය සහ වාර්ෂික පදනමින් පසුගිය අවුරුදු 3 තුළ ලාභය කොපමණද;

(iii) ලාභාංශ ගෙවා තිබේද;

(iv) එසේ නම්, ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(v) පෞද්ගලීකරණය කරන ලද ප්‍රතිශතයක් ද සමග වාර්ෂික පදනමින් පසුගිය වසර 10 තුළ පෞද්ගලීකරණය කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(vi) රජයට කොටස් අයත් පෞද්ගලීකරණය කරන ලද ආයතනවලින් ලැබූ ලාභාංශ කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත (අ) කොටසේ (i), (ii), (iii) හා (iv) ට අදාළව යෙදවූ ප්‍රාග්ධනය, රැකියා සංඛ්‍යාව සහ බදුවලට පෙර සහ පසු ලාභය සහ බදු තනි තනිව සහ සාමූහිකව කොපමණදැයි එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0045/'08

2\.

ගරු රවි කරුණානායක මහතා,— ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂය සහ 2007 වර්ෂය සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ලැබූ සම්පූර්ණ ලාභය කොපමණද;

(ii) ලීටරයක් අලෙවි කිරීම සඳහා වන සමස්ත පිරිවැයෙහි සංයුතිය කවරේද;

(iii) එකතුකර ඇති ලාභාන්තිකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කාලසීමාව තුළ අලෙවි කරන ලද පෙට්‍රල්, ඩීසල්, උදුන් තෙල්, භූමිතෙල් හා ගුවන් යානා ඉන්ධන ලීටර් ප්‍රමාණය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කළ ප්‍රමාණයත්, ආනයනය කළ ප්‍රමාණයත්, එම ප්‍රමාණයන් සඳහා ඇස්තමේන්තු කළ පිරිවැය හා ලාභාන්තිකයන් සමග කවරේද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0050/'08

3\. ගරු රවි කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගරු අමාත්‍යතුමා සහ ඔහුගේ ලේකම්වරයා ඔවුන් විදේශ කටයුතු අමාත්‍යධුරයේ සහ ලේකම් ධුරයේ වැඩ භාරගත් දා සිට සංචාරය කර ඇති රටවල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ එම සංචාරවලදී ඔවුන් මුණගැසී ඇති පුද්ගලයින්ගේ නම් සහ තනතුරු කවරේද;

(iii) එම සංචාර සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සංචාරවලදී ලබාගත් වාසි සහගත තත්ත්වයන් පිළිබඳ වාර්තාවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම එකිනෙක සංචාරයට වැය වූ වියදම කොපමණද;

(ii) ඔවුන් කැටුව ගිය පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) ඒ කැටුව යෑම් වලට හේතුද සමඟින් ඔවුන් නිසා වැය වූ මුදල කොපමණද;

(iv) අමාත්‍යතුමා සහ ඔහුගේ ලේකම්වරයා එකවිට රටින් බැහැරව නොසිටිය යුතු යැයි ජනාධිපතිතුමා විසින් නියෝගයක් පනවා තිබේද;

(v) මෙය අවස්ථා ගණනාවකදීම කඩකර නැතිද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) (i) වත්මන් අමාත්‍යතුමාට පෙර සිටි විදේශ අමාත්‍යතුමාගේ නම කුමක්ද;

(ii) එතුමා අමාත්‍යධුරය භාරගත් දිනයත් එතුමා විසින් සිදුකළ විදේශ සංචාර සංඛ්‍යාවත් ඊට වැය වූ මුදලත් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0127/'08

4\. ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1979 අංක 63 දරන පළාත් පාලන නිවාස (සංශෝධන) පනත යටතේ, බස්නාහිර පළාතේ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රදේශ අනුව නිවාස යෝජනාක්‍රම සංඛ්‍යාව වෙන් වෙන්ව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) වසර 20ට වැඩි කුලී පදනම මත ඇති නිවාස ඒ ඒ පළාත් පාලන ආයතනය විසින්, දේපළ බැහැර කිරීමේ සාධන පත්‍රයක් මගින් අයකිරීමක් නොමැතිව පවරා දෙන්නේද; සහ

(ii) එයට බාධාවක් ඇත්නම් ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0172/'08

5\.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රාජ්‍ය අනුග්‍රහය ඇතිව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාතලේ හන්දිය, කුරුන්දන්කුලමේ සී/ස ජනතා ලංකා මිරිස් සමාගම නමින් සමාගමක් පිහිට වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේනම් එම සමාගමේ සභාපතිවරයා කවුරුන්ද;

(ii) අධ්‍යක්ෂ මණ්ඩලයක් හෝ නිලධාරි මණ්ඩලයක් පත්වූයේ නම්, ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) සමාගම පිහිටුවීම සඳහා උතුරු මැද පළාත් සභාවේ හෝ රජයේ මුදල් හෝ සම්පත් යෙදවූයේද;

(iv) එසේනම් මුදල් යෙදූ ආයතන හා මුදල් ප්‍රමාණය කොපමණද;

(v) වෙනත් පහසුකම් සැලසුවේ නම් ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම සමාගමට ගොවීන් සාමාජිකයින් ලෙස බඳවා ගත්තේද;

(ii) එසේනම් ඔවුන්ගේ නම්, ලිපිනයන්, කොටස් මුදල, සාමාජික මුදල හෝ එලෙස එකතු කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) සාමාජික මුදල් යෙදවූයේ කවර කටයුත්තක් සඳහා ද;

(iv) සාමාජික කොටස් මුදල් ආපසු ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඈ) (i) අතහැර දමා තිබූ මෙම සමාගම නැවත ආරම්භ කළේ නම් ඒ කවදාද;

(ii) ඒ සඳහා ගමනැගුම ව්‍යාපෘතිය මගින් මුදල් වෙන්කර තිබේනම්, අදාළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0183/'08

6\.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහවැලි "එච්" කලාපයේ තඹුත්තේගම හා ගල්නෑව නගරවල කොපමණ වාණිජ ඉඩම් කට්ටි ප්‍රමාණයක් ජනතාවට ලබාදී තිබේද;

(ii) මෙසේ වාණිජ ඉඩම් ලබාදී තිබේනම්, කවර වර්ෂයක කවර පදනමකින් ඒවා ලබාදී තිබේද;

(iii) මෙසේ ලබාදී ඇති ඉඩම්වලින් කොපමණ සංඛ්‍යාවකට ජයභූමි, ස්වර්ණ භූමි හෝ කවර හෝ පදනමකින් ඉඩම් ඔප්පු ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ ඔප්පු ලබා දී ඇති අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) මෙම නගර දෙකේ ඉඩම් ඔප්පු ලබාදීමට කොපමණ සංඛ්‍යාවක් සිටින්නේද;

(iii) එසේ ඉඩම් ඔප්පු ලබාදීමට නියමිත අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වාණිජ ඉඩම් ඔප්පු ලබාදීමට කවර ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්නේද;

(ii) ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී ව්‍යාපාර වැඩි දියුණු කරගැනීමට නොහැකිව අපහසුතාවයට පත්ව ඇති ව්‍යාපාරිකයින් සඳහා කඩිනමින් ඔප්පු ලබාදීමට අවශ්‍ය කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0202/'08

7\.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දේශීය වෛද්‍ය (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0314/'08

8\.
ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පූනෑව, නාගදරණෑව ලිපිනයෙහි එස්. සුනිල් ආනන්ද මහතා, වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ විශේෂ කොමසාරිස්වරයා ලෙස 2003.01.16 වැනි දින සිට 2007.02.07 දින දක්වා සේවය කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) 2007.02.17 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ආණ්ඩුකාරතුමා විසින් මොහු, මෙම තනතුරින් ඉවත්කර ඇත්තේ කවර හේතූන් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 1 වන පන්තියේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු වන මොහු විසින් 2006.12.31 වැනි දින දක්වා කවර හෝ අඩුපාඩුවක් නොමැතිව ප්‍රාදේශීය සභාවේ කටයුතු ක්‍රියාත්මක කළ අතර, විගණන පරීක්ෂණ ද අවසන් කර ඇති බවත්;

(ii) වවුනියාව සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් මොහුගේ සේවය ප්‍රශංසනීය බවට කරුණු ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) දේශපාලන පළිගැනීම් මත මොහු සේවයෙන් ඉවත්කර තිබේද;

(ii) එසේ නම්, මොහු නැවත එම තනතුරට පත්කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0389/'08

9\. ගරු අචල ජාගොඩගේ මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2007 වර්ෂය තුළ එතුමාගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0433/'08

10\. ගරු ජේමසිරි මානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනන්වල කැබලිපොල මාර්ගය එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය සංවර්ධනය කිරීමට කොපමණ මුදලක් වෙන්කර තිබේද;

(ii) එම මාර්ගයේ දිග හා පළල කොපමණද; සහ

(iii) මෙම මාර්ගයට අදාළ ඇස්තමේන්තු සකස් කළ පාර්ශ්වයන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0488/'08

11\.
ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ප්‍රතිනිර්මාණ හා සංවර්ධන නියෝජිතායතනය (RADA) ආරම්භ කරනු ලැබුවේ කවදාද;

(ii) ඒ කවර නෛතික පදනමක් මතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ආයතනයේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරීන් ඇතුලු මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ තනතුරු, අධ්‍යාපන සුදුසුකම්, වැටුප් හා දීමනා සහ බඳවා ගනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම ආයතනයෙන් භාවිතා කිරීම සඳහා ලබාදී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ ප්‍රධාන නිලධාරීන් සඳහා ඉහත වාහන වෙන්කර ඇති ආකාරය, වාහනයේ වර්ගය සහ අංකය කවරේද;

(iii) එම වාහන කුලී, කොන්ත්‍රාත් හෝ වෙනත් කවර හෝ ආකාරයකට ලබාගත්තේ නම්, ඒවා ලබාගත් පදනම සහ එම එක් එක් වාහනය සඳහා වැයකරනු ලැබූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0616/'08

12\.
ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ වැඩසටහන යටතේ පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රජා සම්බන්ධතා නිලධාරීන් ලෙස බඳවා ගනු ලැබූ නිලධාරීන්ට අදාළ තනතුරු නාමයන් ලබා දී නොමැති බවත්;

(ii) නියමිත උසස්වීම් සඳහා ක්‍රමවේදයක් සකස්කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වෘත්තීය ගැටළු නිරාකරණය නොකිරීමට හේතුව කවරේද;

(ii) එම ගැටළු නිරකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0507/'08

13.

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීගිරිය පුරාවිද්‍යා සංවර්ධන කටයුතු (ලෝක උරුම නගරය ) සඳහා යෝජිත ව්‍යාපෘතිය ආරම්භ කළේ කවදාද;

(ii) එහි පළමු පියවර නිම කරන ලද්දේ කවදාද;

(iii) එම අදියරේදී නිම කරන ලද කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙවැනි පියවර සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට නිකුත් කළ අතිවිශේෂ ගැසට් නිවේදන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර වර්ෂවලද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉඩම්වලින් ඉවත්වන ලෙස දැනුම් දී ඇත්තේ කවර වර්ෂයේද;

(ii) එසේ වුවත්, තවමත් වන්දි මුදල් හෝ විකල්ප ඉඩම් ලබා නොදුන්නද, 1979 අංක 8 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතේ 39(අ) වගන්තිය අනුව මෙම ඉඩම් රජයෙන් අවසතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0509/'08

14.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකාවේ රැකියා සඳහා 2006 –2007 වර්ෂවල පැමිණි විදේශිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් පැමිණියේ කවර රටවල් වලින්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) ඔවුන් පැමිණියේ රජයේ හෝ පුද්ගලික අංශයේ වතු, කම්හල්, තැනීම්, ගොඩනැගිලි යන අංශ සඳහා ද යන්න වෙන් වෙන්ව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මොවුන්ට වීසා ලබා දීම සිදු කළේ කෙසේද;

(ii) මෙලෙස මොවුන් ගෙන්වීමට පියවර ගන්නේ සේවක හිඟය මග හැරවීමටද;

(iii) 2006 සහ 2007 වසර වල විදේශ විනිමය ලෙස මෙම ශ්‍රමිකයින් මව් රටට යැවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) මෙහිදී විනිමය පාලනයක් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0609/’08

15.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 වර්ෂයේ මැයි මස වන විට පැවති රාජ්‍ය බැංකු පොලී ප්‍රමාණයන් කවරේද;

(ii) 2003 ජනවාරි මස වන විට පැවති පොලී ප්‍රමාණයන් කවරේද;

(iii) 2005 මැයි මස වන විට පැවති රාජ්‍ය බැංකු පොලී ප්‍රමාණයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2001 පාර්ලිමේන්තු මැතිවරණයෙන් බලයට පත් රජය කවරේද;

(ii) 2004 පාර්ලිමේන්තු මැතිවරණයෙන් බලයට පත් රජය කවරේද;

(iii) 2004 වර්ෂයේ පත්වූ රජයට පසු මේ දක්වා පොලී අනුපාතයන් වැඩිවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2009) - (අටවැනි වෙන්කළ දිනය) — කාරක සභාව.

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධූරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධූරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධූරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |
| සාමාජිකයින් | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය අනුව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිගේ හා උප සභාපතිගේ වැටුප් 2006.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

උප සභාපති

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 50,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 12.000.00 | මාසික |
| | එකතුව | රු. 62,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුප් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, 2006 වර්ෂයේ සිට මේ දක්වා කොමිෂන් සභාවේ උපසභාපති තනතුරේ සේවය කර ඇති මහාචාර්ය ලාල් පෙරේරා මහතාට සහ දැනට එම තනතුර දරන ආචාර්ය ජී.ඩී. ගුණවර්ධන මහතාට ද මෙම වැටුප් වැඩිවීම අදාළ විය යුතු යැයිද, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට හා උප සභාපතිට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අධ්‍යාපන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 126— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් හත්සිය තිස් හයකට (රු. 1,736,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 126 | — | අධ්‍යාපන අමාත්‍යාංශය |
| වැඩ සටහන | 2 | — | සුභ සාධනය |
| | | පුනරාවර්තන වියදම් | රු.1,736,000,000 |
| | | ප්‍රාග්ධන වියදම් | රු.— |
| | | එකතුව | රු.1,736,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 නොවැම්බර් මස 04 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 8 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 7 දක්වා එකතුව රුපියල් 25,303,980,332.

*11.

ප්‍රවාහන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 306— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් පණහකට (රු. 1,050,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 306 | — | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන කටයුතු | | |
| | | | පුනරාවර්තන වියදම් | රු. | 186,000,000 |
| | | | ප්‍රාග්ධන වියදම් | රු. | 864,000,000 |
| | | | එකතුව | රු. | 1,050,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 නොවැම්බර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 9 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 8 දක්වා එකතුව රුපියල් 27,039,980,332.

*12.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත යටතේ නියමය— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනතේ 48 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජුනි මස 06 දිනැති අංක 1552/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.11.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*13.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම" දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000<br>රු. 680,000,000 | සිට<br>දක්වා |

| | | | |
|---|---|---|---|
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000 සිට<br>රු. 3,900,000,000 දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 400,000,000 සිට<br>රු. 550,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*14.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*15.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*16.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*17.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*18.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*20.
ජාතික ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.
සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*23.
ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*25.
ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*26.
අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*27.
ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*28.
ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*29.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*30.
අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*31.
සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*32.
ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

33.
දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.
උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.
ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.
තාලියවක ශ්‍රී ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.
එක්සත් ජනඉසුරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.
පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.
ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.
"විසර්ජන පනත් කෙටුම්පත (2009)" නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0415/'08

1.
ගරු පියසිරි විජේනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "දැයට කිරුළ 2008" ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ ආයතන කවරේද;

(ii) එක් එක් අමාත්‍යාංශය විසින් තම අමාත්‍යාංශයට අයත් කවර ආයතන, එම ප්‍රදර්ශනය සඳහා සම්බන්ධකර ගෙන තිබුණේද;

(iii) එම එක් එක් දෙපාර්තමේන්තුවේ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය සමාගම්වලින් දැරූ වියදම් වෙන වෙනම කොපමණද;

(ii) එම වියදම් සඳහා මුදල් ලබා ගත්තේ අදාළ ආයතනයෙන්ද එසේ නොමැති නම් වෙනත් මාර්ගයකින්ද;

(iii) ප්‍රදර්ශනය සඳහා වියදම් වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?